ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 10 ශ්‍රේණිය - ව්‍යාපාර සංවිධාන

## පැවරුම 4

1. ලාභ අරමුණු කරගත් පෞද්ගලික අංශයේ ඇති ව්‍යාපාර **පහක්** නම් කරන්න.

2. ලාභ අරමුණු කරනොගත් පොදු අංශයේ ඇති ව්‍යාපාර **දෙකක්** නම් කරන්න.

3. පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය ද අසත්‍ය ද** යන්න සඳහන් කරන්න.
   (අ) හවුල් ව්‍යාපාරයක අවම සාමාජික සංඛ්‍යාව **දෙදෙනකු** වන අතර උපරිම සාමාජික සංඛ්‍යාව **20** කි.
   (ආ) ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාරවල ප්‍රධාන අරමුණ වන්නේ සාමාජිකයින්ගේ සාමාජිය සුභසාධනයයි .
   (ඇ) ව්‍යාපාර සංවිධාන පරිමාණය අනුව වර්ග කිරීමේ දි සුලු පරිමාණ ව්‍යාපාර හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙස වර්ග කළ හැක.
   (ඈ) ලොව බහුලව පවතින ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ ඒකපුද්ගල ව්‍යාපාර වේ.

4. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක **හතරක්** නම් කරන්න.

5. ව්‍යාපාර සංවිධාන හිමිකාරීත්වය හා අරමුණ අනුව වර්ග කෙරේ. මෙම වර්ගීකරණය ගැලීම් සටහන් දෙකක් මගින් ඉදිරිපත් කරන්න.

## පැවරුම 5

1. හිමිකාරීත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම ගැලීම් සටහනකින් දක්වන්න.

   ❖ සමන්ත ස්ටෝර්ස්
   ❖ ශ්‍රී ලංකා වරාය අධිකාරිය
   ❖ රොෂාන් සහ සහෝදරයෝ
   ❖ ඉසුරු ක්‍රීඩා සමාජය

2. ඒක පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි **හතරක්** දක්වන්න.

3. පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය ද අසත්‍ය ද** යන්න සඳහන් කරන්න.
   (අ) පහසුවෙන් ආරම්භ කළ හැකිවීම , ස්වාධීන තීරණ ගැනීමට හැකියාවක් පවතින ව්‍යාපාර සංවිධාන ක්‍රමයකි ඒකපුද්ගල ව්‍යාපාර.
   (ආ) සංස්ථාපිත සමාගම්වලට අඛණ්ඩ පැවැත්මක් නොමැත.
   (ඇ) ඒකපුද්ගල ව්‍යාපාරයකට සාපේක්ෂව හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ දක්නට ඇති වාසියක් වන්නේ නීතිමය බලපෑම අඩුවීමයි.
   (ඈ) කුඩා ප්‍රාග්ධනයක් ආයෝජනය කර ඇති අඩු සේවක සංඛ්‍යාවක් සිටින , වෙළඳපොළ කොටස් කුඩාවූ ව්‍යාපාර සුලු හා මධ්‍යපරිමාන ව්‍යාපාර වේ.

4. සංස්ථාපිත සමාගම්වල දැකිය හැකි ලක්ෂණ හතරක් නම් කරන්න.

5. මහාපරිමාණ ව්‍යාපාර සංවිධාන ක්‍රමයක ලක්ෂණ හතරක් නම් කරන්න.

පැවරුම 1

1. නිෂ්පාදන සාධක නම් කරන්න.

2. ව්‍යවසායකුගේ ලක්ෂණ 03ක් නම් කරන්න.

3. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

   (අ) ව්‍යවසායකයා යනු ව්‍යාපාර අවධානම් දරමින් , නව්‍යතා සම්පාදනය කරමින් ව්‍යාපාර කටයුතු පිළිබඳ තීරණ ගන්නා පුද්ගලයෙකි.

   (ආ) විසිතුරු මැටි නිෂ්පාදන තොග වශයෙන් වෙළෙඳුන්ගෙන් මිලට ගෙන අලෙවි කිරීම සේවා සැපයීමේ ව්‍යාපාර වේ.

   (ඇ) ව්‍යාපාර පරිසරය යටතේ නව නගර නිර්මාණය හා අධිවේගී මාර්ග ඉදිකිරීම ව්‍යාපාරවලට බලපාන තර්ජනය කි.

   (ඈ) රටක සේවා වියුක්තිය ඉහල යාම රටේ සංවර්ධනයට බාධාවකි. මෙය දේශපාලන පරිසරයට අයත් සාධකයකි.

4. ඇල්මැති පාර්ශව දෙකක් නම් කර ඔවුන්ගේ අරමුණු දෙකක් සඳහන් කරන්න.

5. ඇල්මැති පාර්ශව දෙකක් නම් කර ඔවුන්ගෙන් ව්‍යාපාරයක් බලාපොරොත්තු වන දායකත්වය සඳහා නිදසුන් දෙක බැගින් ඉදිරිපත් කරන්න.

පැවරුම 2

1. ඔබගේ පාසල සඳහා ඇල්මැති පාර්ශව හතරක් දක්වන්න.

2. ව්‍යාපාරයක අභ්‍යංතර පරිසරය කෙරෙහි බලපාන සාධක දෙකක් දක්වා ඔවුන් ව්‍යාපාරයේ සාර්ථකත්වයට හේතුවන ආකාරය දක්වන්න.

3. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

   (අ) ව්‍යාපාර ඇල්මැති පාර්ශවයක් වන සේවකයින් විසින් සාධාරන වැටුපක් ලබා ගැනීම , රැකියා සුරක්ෂිතතාවය ව්‍යාපාරයකින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු කිහිපයකි.

   (ආ) මෙවර අලුත් අවුරුද්ද සඳහා රජය විසින් සහල් සඳහා පාලන මිලක් ඇති කිරීම ආර්ථික පරිසර සාධකයට අයත්ය.

   (ඇ) යම් රටක මුදල් ඒකකයක් තවත් රටක මුදල් ඒකකයක් සමග හුවමාරු වන අනුපාතය විදේශ විනිමය අනුපාතයයි.

   (ඈ) අභ්‍යන්තර පරිසර අධ්‍යයනය තුලින් ව්‍යාපාරයේ ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැක.

   (ඉ) භූගෝලීය පිහිටීම නුසුදුසුවීම ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයට අයත් දුර්වලතාවයක් නොවේ.

4. තාක්ෂණික වෙනස්වීම නිසා ව්‍යාපාරවල සිදු වූ වෙනස්කම් වලට නිදසුන් දෙකක් දක්වන්න.

5. ගෝලීයකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

පැවරුම 3

1. පහත සඳහන් රටවල් භාවිතා කරන විදේශ මුදල් වර්ගය සඳහන් කරන්න.

- ඇමරිකා එක්සත් ජනපදය
- බ්‍රිතාන්‍ය
- ජපානය
- ඉන්දියාව
- නෙදර්ලන්තය

2. ව්‍යාපාර සංවිධානයක් යනු කුමක් ද?.

3. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.

(අ) ව්‍යාපාර සඳහා රජය විසින් ලබාදෙන ප්‍රවාහන හා ජල විදුලිබල පහසුකම් යටිතල පහසුකම් ලෙස හඳුන්වයි.

(ආ) රටක පොදු මිල මට්ටම නිතරම ඉහළ පහළ යාම උද්ධමනය වේ.

(ඇ) හිමිකාරීත්වය මත පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය ලෙස ව්‍යාපාර වර්ග කල හැක.

(ඈ) පහසුවෙන් ආරම්භකළ හැකි , ස්වාධීන තීරණ ගැනීමට හැකියාවක් පවතින ව්‍යාපාර හවුල් ව්‍යාපාර වේ .

4. පෞද්ගලික අංශය යටතේ ක්‍රියාත්මක වන ලාභ නොලැබීමේ පරමාර්ථයෙන් පවත්වාගෙන යන ව්‍යාපාර සංවිධාන දෙකක් නම් කරන්න.

5. පොදු අංශය යටතේ පවතින ව්‍යාපාර සංවිධාන දෙකකට නිදසුන් දෙන්න.

.